# විද්‍යෝදය
# ආර්ථික විද්‍යා

ආර්ථික විද්‍යා විෂය සංගමයේ
2000 / 2001 ප්‍රකාශනයකි.

අධික්‍ෂණය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. ආර්. කෝදාගොඩ මහතා.

සංස්කරණය
පූජ්‍ය සේනාදිරියාගම ධම්මජෝති හිමි
විජිත බී. අත්තනායක

පස්වන කලාපය 2001

# පිදුම

සොඳුරු සුපසන් සිතින්

සිප් සතර පුරනා

ඇදුරු සෙවණින් නිතින්

නැණ නුවන් ලබනා

මහරු ගුණයෙන් බැතින්

සරසවිය දිනනා

සොඳුරු නව කුසුම් වෙත

පුද පඬුරු පුදනා...

## ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධානතුමාගෙන්...

ආර්ථික විද්‍යා විෂය සංගමය මගින් පළ කරනු ලබන මෙම සඟරාවට පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි. දැනුම වර්ධනය කර ගැනීමේදී දේශන හා නිබන්ධන පංතිවලට අමතරව විශාල කාර්යභාරයක් ඉටු කරනුයේ විෂය සංගම්ය. මෙම කාර්යය ඉටු කිරීමේදී විශ්ව විද්‍යාලය තුළ කැපී පෙනෙන විෂය සංගමයක් ලෙස ආර්ථික විද්‍යා විෂය සංගමය හැඳින්විය හැකිය. 2000-2001 අධ්‍යයන වර්ෂය තුළ මෙම විෂය සංගමයට තේරී පත්වූ නිළධාරී මණ්ඩලයේ කැපවීම පිළිබිඹු කරන මහගු අවස්ථාවක් ලෙස මෙබඳු සඟරාවක් එළි දැක්වීමට පියවර ගැනීම පෙන්නුම් කළ හැකියි. මෙම කාර්යයේදී නිළධාරී මණ්ඩලයට මාර්ගෝපදේශකත්වය ලබා දුන් ආර්ථික විද්‍යා විෂය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ලෙස කටයුතු කරන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩී. පී. එන්. චන්ද්‍ර කුමාර මහතාද මෙහිදී සිහිපත් කළ යුතු වේ.

ඉදිරි අධ්‍යයන වර්ෂ වලදී මෙම සංගමයට තේරී පත්වන නිළධාරීන්ටද මෙය පූර්වා දර්ශයක් වේයයි සිතමි.

**පී. අතුකෝරල**
අධ්‍යයනාංශ ප්‍රධාන *(ආර්ථික විද්‍යා)*

## ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකතුමාගෙන්...

ආර්ථික විද්‍යා විෂය සංගමය කවදත් සක්‍රීය සංගමයක් ලෙස විවිධාකාර අධ්‍යයන හා වෙනත් ඵලදායි කාර්යයන් හි ඉහමත් දායකත්වයක් දක්වයි. 2002 වසරේ ඔබ අතට පත්කෙරෙන මෙම කුඩා සඟරාව එම දායකත්වය අඛණ්ඩව පවත්වාගෙන යාමට දරණ ලද උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස මා දකිමි.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්යවරුන් කිහිපදෙනෙකුගේ ලිපිවලින් සමන්විත වන මෙම සඟරාව විශේෂයෙන් ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව හදාරණ අභ්‍යන්තර හා බාහිර උපාධිමෙන්ම වෙනත් පාඨමාලා හදාරණ සහ සාමාන්‍ය පාඨකයා සඳහා ද සුදුසු වන්නක් ලෙස හැඳින්විය හැකිය.

**ඩී. පී. එස්. චන්ද්‍රකුමාර**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

## ආර්ථිකවිද්‍යා විෂය සංගමයේ සභාපතිතුමාගෙන්...

නූතන සරසවි ශිෂ්‍යයා දේශන ශාලාවටත්, විභාගයටත් පමණක් සීමා වූ පිරිසක් බවට චෝදනා නැගේ. නමුත් එම චෝදනා පුස්සක් කිරීමට "උපාධියට නව එළියක්" විශේෂ වැඩසටහන තුළින් හැකි වූ බව මගේ හැඟීමයි. එයට හොඳම නිදසුන් ලෙස එකොළොස් වසරකට පසුව "විද්‍යොදය ආර්ථික විද්‍යා" සඟරාව එළි දක්වීමට ලැබීම සැළකිය හැකිය.

ආර්ථික විද්‍යා විෂය සංගමය මගින් ක්‍රියාත්මක කළ "උපාධියට නව එළියක්" විශේෂ වැඩසටහන යටතේ ආර්ථික විද්‍යාවට අදාළ දේශන, විවාද තරගයක් හා සංවාද මණ්ඩපයක්ද පැවැත්වීමට අපට හැකි විය. එසේම එම වැඩ සටහනේ එක් අංගයක් ලෙස විවිධ අපහසුතා නිසා එකොළොස් වසරක් ප්‍රකාශයට පත් කිරීමට නොහැකි වූ "විද්‍යොදය ආර්ථික විද්‍යා"සඟරාව විවිධ බාධක හා මූල්‍ය අපහසුතා හමුවේ වුවත් අප නිල කාලය තුළ නැවත නව මුහුණුවරකින් ප්‍රකාශයට පත්කිරීමට ලැබීම ඉමහත් සතුටකි.

"උපාධියට නව එළියක්" විශේෂ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී හා "විද්‍යොදය ආර්ථික විද්‍යා" සඟරාව නැවත ප්‍රකාශයට පත්කිරීමේදී අපට මහත් ධෛර්යයක් ලබා දුන් ආර්ථික විද්‍යා අධ්‍යයනාංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී. අතුකෝරල මැතිතුමාටත් නිබඳ අප සමග සිටිමින් අපට ශක්තියක් වූ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජී. පී. එස්. චන්ද්‍ර කුමාර මහතාටත්, සඟරාව එළිදක්වීම සඳහා ඉතා වැදගත් කාලෝචිත ලිපි ලබා දුන් ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලයටත් අධීක්ෂණ කටයුතු සිදු කළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. ආර්. කෝදාගොඩ මහතාටත් අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරමු.

අප විසින් ක්‍රියාත්මක කළ "උපාධියට නව එළියක්" විශේෂ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට හා "විද්‍යොදය ආර්ථික විද්‍යා" සඟරාව ප්‍රකාශයට පත්කිරීමට විශාල ධනයක් හා ශ්‍රමයක් අවශ්‍ය විය. මෙහිදි වෙළඳ දැන්වීම් ලබා දීමෙන් අපට අනුග්‍රහය දක්වූ අනුග්‍රහක භවතුන්ටත්, වෙළඳ දැන්වීම් සපයා දීමේදි සහය වූ යොයුරු සොයුරියන්ටත්, විවිධ අයුරින් දායක වූ ආර්ථික විද්‍යා විෂය සංගමයේ සැමටත් නන් අයුරින් සහයවූ සරසවියේ සහෝදර සහෝදරියන්ටත් ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත්, සඟරාවේ මුද්‍රණ කටයුතු කර දුන් සංහිඳ ප්‍රින්ටර්ස් අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, සුදුසු පිටකවරයක් සකස්කර දුන් ශාම් කැල්ලපත සොයුරාටත් අපගේ හද බැදි ස්තුතිය පුදු කරමු.

**සේනාදිරියාගම ධම්මජෝති හිමි**
සභාපති *(ආර්ථික විද්‍යා විෂය සංගමය)*

## පෙළ ගැස්ම


1. ශ්‍රී ලංකාවේ අපරාධ හා සංවර්ධනය
   - ආචාර්ය එච්. එම්. වී. එන්. ආර්. හේරත් මහතා

2. ජාත්‍යන්තර වෙළඳාමේ පදනම
   - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩී. පී. එස්. චන්ද්‍රකුමාර මහතා

3. The IMF - World Bank and Social welfare Policies in Sri Lanka
   - Senior Lecturer, P. Athukorala (Head of Dept./Economics)

4. ශ්‍රී ලංකාවේ ජාතික අර්බුදය; වර්ධනය සහ විසඳුම් පිළිබඳ දළ ඇගයුමක්
   - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටෙරන්ස් පුරසිංහ මහතා

5. ආර්ථික විද්‍යා ක්‍රමවේදයට ගණිතයෙන් ලැබෙන පිටිවහල
   - කථිකාචාර්ය එස්. පී. බී. හීන්කෙන්ද මහතා

6. ඉල්ලුම් නම්‍යතාවය
   - කථිකාචාර්ය ඩබ්ලිව් බී. ආර්. දමයන්ති මහත්මිය

7. වෙළඳපල ආකෘතීන්
   - සහකාර කථිකාචාර්ය එච්. එම්. එන්. පී. හේරත් මහතා